**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2019**

**---------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 66,615,099 ක් වූ දැව භාණ්ඩ හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 649 අනුව ජංගම නොවන වත්කම් වල ඵලදායී ආයු කාලය ඇස්තමේන්තු කර ඇත. එසේම එම ප්‍රමිතය ප්‍රකාරව දැව භාණ්ඩ හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට අපේක්ෂා කරන බව තවදුරටත් සඳහන් කරණු කැමැත්තෙමි. | ශ්‍රී ලංකා රජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යයන පරිශ්‍ර විදුලි ජනක යන්ත්‍රයක 2018 වර්ෂයට අදාළ ක්ෂය රු. 17,350 ක් වුවද එය රු. 17,349,067 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ක්ෂය වෙන් කිරීමේ ගිණුම රු. 17,331,717 ක් මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා තිබුණි. එම වරද සමාලෝචිත වර්ෂයේ දී අතීතානුයෝගීව ගලපා නොතිබීම නිසා ශුද්ධ වත්කම් සහ දේපල පිරියත හා උපකරණ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි. | එම මුදලට අදාළව 2018 වර්ෂයේ ක්ෂය ගණනය කිරීම ස්ථාවර වත්කම් ලේඛනයේ නිවැරදිව සටහන් කර ඇති අතර, ක්ෂය ගැලපීම් ලේඛනය රු. 17,349.67 වෙනුවට රු. 17,349,067.00 ලෙස පරිගණක ගත කිරීමේදී වරදක් සිදුව ඇති බව පිළිගනිමි. 2020 වර්ෂයේදී මෙය නිවැරදි කර ඇත. | අතීතානුයෝගීව නැවත ගැලපීම් සිදුකර වරද නිවැරදි කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව ආයතන 08 ක් වෙත නිරවුල් කළ යුතු එකතුව රු. 1,700,120 ක් වූ රැඳවුම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා කොන්ත්‍රාත් මත රඳවා ගැනීම රු. 936,514.00 ක් මහෝපාධ්‍යායනිල නිවාසය ඉදිකිරීමේදී සිදු වී ඇති අඩුපාඩු නිවැරදි කරන තෙක් රඳවා ගෙන ඇත.<br>ඉලෙක්ටෝ මෙටල් ප්‍රෙසින්ස් ආයතනයේ රු. 489,933.00 ක මුදල 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට නියමිතය.<br>සුකිත් ඩිසයින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ආයතනයේ රු. 56,548.00 ක මුදල ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක් රඳවා ගත යුතු වේ. ඉතිරි රැඳවුම් මුදල් ද නිරවුල් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. | අදාළ ශේෂ විශ්ලේෂණය කර නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි **371 (2) (ආ)** | තත්කාර්ය අත්තිකාරම් සඳහා සකස් කරන ඇස්තමේන්තුවල ඇතුළත් කාර්යයන් නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් අවස්ථා 17 කදී ලබා දී තිබුණු එකතුව රු. 475,200 ක අත්තිකාරම්වලින් සියයට 41 සිට සියයට 100 ත් අතර පරාසයක අත්තිකාරම් ආපසු පියවා තිබුණි. | අදාළ කාර්යය සඳහා අපේක්ෂිත වියදම් හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. එහෙත් පාලක සභා, අනෙකුත් අනු කමිටු රැස්වීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා ඇතැම්විට සාමාජිකයන්ගේ නොපැමිණීම මත ඇස්තමේන්තුගත මුළු අත්තිකාරම උපයෝගී වීමක් සිදු නොවේ. එසේම ඇතැම් අවස්ථාවන්හී දී අදාළ අනු කමිටුව රැස්වීමට නියමිත ආසන්න දිනයක දී අවලංගු වීම මත සම්පූර්ණ අත්තිකාරම නැවත පියවීම සිදු වී ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ආ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 26.1 උපවගන්තිය | පාඨමාලාවලට සෑහෙන සුදුසු ආචාර්ය මණ්ඩලයක් බඳවාගත යුතු අතර එසේ නොමැති නම් අලුත් පාඨමාලා ආරම්භ නොකළ යුතු බවත් දක්වා තිබිය දී විශ්වවිද්‍යාලයේ අනුමත කථිකාචාර්ය තනතුරු 12 ක් පුරප්පාඩු වී තිබියදී සමාලෝචිත වර්ෂය තුළ බාහිර කථිකාචාර්යවරු 24 දෙනෙකු බඳවා ගෙන රු. 4,668,363 ක් දේශන ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. | අධ්‍යයන නිවාඩු, සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටින ආචාර්යවරුන් විසින් සිදු කරනු ලබන විෂයන් සඳහා සහ දැනට පුරප්පාඩුව පවතින ආචාර්ය තනතුරු සඳහා බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන ඇති අතර පීඨාධිපතීන් සහ අධ්‍යයනාංශය ප්‍රධානීන් මේ පිළිබඳව ඇනුවත් කර ඇති අතර අවම බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමක් සඳහා අවශ්‍ය පියවර ගැනීමට අධ්‍යයනාංශ මඟින් කටයුතු කරනු ලබයි. එමෙන්ම පුරාවිද්‍යාව වැනි සුවිශේෂ වූ විෂය කරුණු අවරණය කිරීම සඳහා සම්පත්දායකයින් බාහිරින් යොදා ගැනීම සිදු කරනු ලබයි. | පුරප්පාඩු පිරවීමසඳහා කඩිනම් පියවර ගෙන බාහිර කථිකාචාර්ය වියදම් අඩුකර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 40,787,889 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,187,367 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 38,600,522 ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර රු. 110,188,000 කින් වැඩිවීමට සාපේක්ෂව අධ්‍යයන දීමනා රු. 31,289,746 කින් හා පාරිතෝෂික දීමනා රු. 54,919,183 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බාහිර කථිකාචාර්යවරුන් මාර්ගයෙන් පවත්වාගෙනආ භාෂා නිපුණතා සංවර්ධන අධ්‍යයනාංශයේ විදේශ භාෂා 4 ක් ඉගැන්වීම සඳහා 2016 වර්ෂයේදී බඳවාගත් කථිකාචාර්යවරියන් 3 දෙනෙකුට වසර 3 ක් ගතවීමටත් පෙර වසර 5 ක් දක්වා අධ්‍යයන නිවාඩු ලබාදී නැවත බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 21 අනුකොටසෙහි 21.1.1 අනුව පරිවාස පිට සිටින හැම ආචාර්යවරයකුම අවුරුදු තුනක මුල් පරිවාස කාලය තුළදී පශ්චාත් උපාධියක් (පර්යේෂණ අංගයක් ද ඇතුළත් වඩා යෝග්‍ය) ලබා ගත යුතු සාමාන්‍යයන් අපේක්ෂා කෙරේ. ඒ වගන්තියෙන් අවසර දී ඇති අවුරුදු හයක පරිවාස කාලය තුළ පශ්චාත් උපාධිය ලබා ගැනීමට අසමත් වුවහොත් පාලක බල මණ්ඩලය විසින් ඔවුන්ගේ සේවය අවසන් කළ යුතුය, යනුවෙන් දක්වා ඇත. | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකර බාහිර කථිකාචාර්ය දීමනා අඩුකර ගැනීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| | ඒ අනුව පරිවාස කාලයේ සිටිය ආචාර්යවරුන් සඳහා අධ්‍යයන නිවාඩු ලබාදිය යුතු වේ. | |
| (ආ) අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් සිදු නොකිරීම හේතුවෙන් මුද්‍රණ යන්ත්‍ර සඳහා භාවිතා කරනු ලබන රු. 188,189 ක් වටිනා තීන්ත හා කාට්‍රිජ් අයිතම 24 ක් වසරකට වැඩි කාලයක සිට හා රු. 112,853 ක් වටිනා තොග අයිතම 586 ක් වසර 3 සිට වසර 5 ක අතර කාලයක් තුළ නිකුත් නොකර ගබඩාව තුළ පැවතුණි. | ඇතැම් ඩුප්ලෝ යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර හා ෆැක්ස් යන්ත්‍ර සඳහා ගබඩාවේ රඳවාගෙන ඇති තීන්ත හා කාට්රේජ් 24 තවදුරටත් රඳවා ගත යුතු දැයි එම යන්ත්‍ර භාවිතා කරන අංශවලින් තහවුරුවක් ලබා ගැනීමෙන් පසු අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. සෙමෙන් නිකුත්වන අයිතම බවද දන්වා සිටිමි. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කිරීමට අවධානය යොමුකළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ 4 (XV) වගන්තිය අනුව කුලී සහ බදු පදනම යටතේ වුවද නේවාසිකාගාර පහසුකම් සපයා ගැනීමට ඉඩකඩ තිබියදීත් එය නොසලකා විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරවල ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව සඳහන් කරමින් වාර්ෂිකව බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කිරීමට කටයුතු කර තිබුණි. මේ අනුව 2015 වර්ෂයේ සිට ඉකුත් වර්ෂ 5 තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම්කර තිබුණු සිසුන් 1,752 දෙනෙකු අතරින් සියයට 37 ක් හෙවත් 652 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණු අතර විශ්වවිද්‍යාලය සතුව සිසුන් 2000 කට අධික ධාරිතාවයක් සහිත දේශන ශාලා සහ ප්‍රමාණවත් පහසුකම් පවතින නමුත් වර්ෂයකට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 110 ත් 140 ත් අතර පරාසයක පවතින බව නිරීක්ෂණය විය. | වාර්ෂිකව බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය 2015/16 වර්ෂයේ 110 සිට 2019/20 වර්ෂය සළකා බැලීමේදී 140 දක්වා වැඩිකර ගැනීමට අවශ්‍ය කටයුතු විශ්වවිද්‍යාලය විසින් සිදුකර ඇත. බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කිරීම විශ්වවිද්‍යාලය මඟින් සිදු කිරීමක් නොකරනු ලබයි. වාර්ෂිකව ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙන් වැඩි පිරිසක් සමාන වෙනත් ආයතනවලට ඇතුළත්ව ඇත. එමෙන්ම ඒක ශිෂ්‍ය පිරිවැය අවම කර ගැනීමේ අරමුණෙන් පවතින සම්පත් සැලකිල්ලට ගෙන ශිෂ්‍ය සංඛ්‍යාව 200 දක්වා වැඩි කිරීමට අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළද පෙර වර්ෂවල බඳවා ගන්නා ප්‍රමාණයම බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. | විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි වන පරිදි බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවධානය යොමු කළ යුතුය. |
| (ආ) පසුගිය වර්ෂ 5 තුළ අභ්‍යන්තර උපාධි 428 ක් පිරිනැමීමට සාපේක්ෂව බාහිර උපාධි 1716 ක් පිරිනමා තිබීම හේතුවෙන් විශ්වවිද්‍යාලය සතු සම්පත් යොදවා ගෙන අභ්‍යන්තර උපාධි පිරිනැමීමට වඩා බාහිර උපාධි පිරිනැමීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබූ බව නිරීක්ෂණය විය. | අභ්‍යන්තර සිසුන් බඳවා ගැනීම සිදුකරනුයේ එක් වර්ෂයක උසස් පෙළ සමත් සිසුන් මත පදනම්ව වන අතර පනත ප්‍රකාරව පැවිදි ශිෂ්‍යයින් සහ ගිහි පිරිමි ශිෂයින් පමණක් බඳවා ගනු ලබයි. නමුත් බාහිර සිසුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් පනත ප්‍රකාරව එවැනි සීමා නොමැති බැවින් සාපේක්ෂව වැඩි ශිෂ්‍ය ප්‍රමාණයක් වාර්ෂිකව ලියාපදිංචි වීම සිදු කෙරේ. | විශ්වවිද්‍යාලයේ පවතින සම්පත් ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි වන පරිදි බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමටත් නියමිත කාලය තුළදී උපාධිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමත් කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බෞද්ධ අධ්‍යයනට හා පාලි භාෂාවට සීමා වූ පර්යේෂණවලට ආධාර කිරීම් සඳහා පිහිටුවා ඇති ජියුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 1,300,000 ක් වූ අතර 2017 වසරේ සිට අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදවා ගෙන නොතිබුණි. | මෙම අරමුදල උපයෝගී කර ගැනීමේ අවස්ථා පුළුල් කර ගැනීම සඳහා අරමුදල් නිර්ණායක සංශෝධනය කර පාලක සභාවෙන් අනුමත කරන ලදී. එම නව නිර්ණායක අනුව අරමුදල් උපයෝගී කර ගැනීමට අපේක්ෂා කෙරේ. | විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීමට අදාළ අරමුදල් උපයෝජනය විධිමත් කළ යුතු ය. |

### 3.4 ව්‍යාපෘති හෝ ප්‍රග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ කොළඹ පරිශ්‍රයේ මහල් පහකින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු. මිලියන 307.5 ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් මත නිර්මාණ සහ ඉදිකිරීම් ප්‍රසම්පාදන ක්‍රමය යටතේ 2017 වර්ෂයේ මිල ගණන් කැඳවා තිබූ අතර 2017 ජූලි මාසයේ දී රු. 548,902 ක් උපදේශන ගාස්තු වශයෙන් වැය කර තිබුණි. තෝරාගත් කොන්ත්‍රාත්කරුට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 05 දින රු. 14,508,834 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබුණ ද 2020 ජූලි 17 වන විටත් ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. මෙම ප්‍රසම්පාදනය සහ රු. මිලියන 219 ක් වූ ප්‍රසම්පාදනයක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවලට රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතයකු පත් කිරීම වෙනුවට විශ්‍රාමික අතිරේක ලේකම්වරයකු පත්කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත. එම ප්‍රදේශය අධිආරක්ෂිත කලාපයක් බැවින් මෙම ඉදිකිරීම ආරම්භ කිරීමට පෙර නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අනුමැතිය ලබා ගත යුතු වේ. එම අනුමැතිය ලද පසු ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවන අතර ඉදිකිරීම් කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු ය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 211 ක්ද, තත්‍ය කාර්ය මණ්ඩලය 186 ක්ද, වූයෙන් තනතුරු 25 ක් පුරප්පාඩුවී පැවතුණි. මේ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 12 ක්ද, අනුමත පරිපාලන තනතුරු වලින් | මහාචාර්ය තනතුරු 07 සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත 2020 වර්ෂය සඳහා කථිකාචාර්ය තනතුරු දෙකක් බවට යටපත් කරවා ගන්නා ලදී. එම කථිකාචාර්ය තනතුරු දහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. | විශ්වවිද්‍යාලයේ කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වා ගෙන යාම සඳහා පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කළ යුතුය. |

| | |
|---|---|
| සහකාර ලේඛකාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී යන තනතුර බැඟින් ද පුස්තකාලයාධිකාරී තනතුරද පුරප්පාඩු වී පැවතුණි. | පුස්තකාලයාධිකාරී 01 – 2019 වර්ෂයේ ද පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව අවම ලකුණු ලබා ගෙන නොතිබුණි.<br><br>ගරු මහෝපාධ්‍යායයන් වහන්සේ ලෙස සමය අධ්‍යයන හා තුලනාත්මක දර්ශනය අධ්‍යයනාංශයේ මහාචාර්ය ස්වාමීන් වහන්සේ පත්වීම හේතුවෙන් පුරප්පාඩුව ඇත. ධූර කාලය අවසන්වීමෙන් පසු නැවත මහාචාර්ය තනතුරෙහි වැඩ භාර ගැනීමෙන් එම තනතුර සම්පූර්ණ වේ.<br><br>කථිකාචාර්ය (ආධුනික) තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇතත් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බැවින් එම තනතුර පිරවීමට නොහැකිය.<br><br>කථිකාචාර්ය (ආධුනික) හා පරිගණක උපදේශක තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 ක තත්‍ය වියදම රු.මිලියන 110.4 ක් වූ අතර ඇස්තමේන්තු වියදම රු.මිලියන 66.8 ක් වූයෙන් ඇස්තමේන්තුගත වියදම සහ තත්‍ය වියදම අතර සියයට 19 ත් සියයට 225 අතර පරාසයක විචලතාවයක් විය. | ඇස්තමේන්තු නැවත සංශෝධනය කළ අතර වැටුප් වැඩි වීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් අතිරේකව ලබා දී ඇත. | වියදම් හා ආදායම් නිවැරදිව පුරෝකථනය කර ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |

**4.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණ ද තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම් වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළඟා වීමට සැලැසුම් සකස් කිරීමේ හා පෙර සූදානම් වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | මේ පිළිබඳ ඉදිරි කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා 117 වන විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත කමිටුවක් පත් කිරීමට අදාළ පාලක සභා පත්‍රිකාව යොමු කොට ඇත. මේ වන විට විශ්වවිද්‍යාලය විසින් පහත පරිදි තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා කටයුතු සිදු කර ඇත. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |